# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 46 දරන බැංකු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **2006** නොවැම්බර් මස **30** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 දෙසැම්බර් මස 1 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල **:** රු. **9.50** යි. තැපැල් ගාස්තුව **:** රු. **5.00** යි.

## 2006 අංක 46 දරන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 නොවැම්බර් මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 47/2006.

### බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1\. මේ පනත 2006 අංක 46 දරන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2\. 1988 අංක 30 දරන බැංකු පනතේ 76ක වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1988 අංක 30 දරන බැංකු පනතේ 76ක වගන්තිය සංශෝධනය කිරීම.

"(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) උපඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

(i) එම බැංකුව යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ ශ්‍රී ලංකාව තුළ දී සංස්ථාගත කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබ ඇති අවස්ථාවක—

(අ) බැංකුව අනිවාර්යයෙන් ගණන් බේරා වසාදැමීම ආරම්භ කළ යුතු අතර, ඒ ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් VIII වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය ; හෝ

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුවද, මුදල් මණ්ඩලය විසින් තැන්පත්කරුවන්ගේ යහපත සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරභාවය සහතිකවීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, මේ අනුඡේදය ක්‍රියාත්මක වීමේ දිනට පෙරාතුව කවර හෝ අවස්ථාවක දී තම බලපත්‍රය අවලංගු කරනු ලැබූ යම් බැංකුවක් සම්බන්ධයෙන් මේ පනත මගින් හෝ එය යටතේ පවත්වාගෙන යාමට එම බැංකුවට බලය ලබා දී ඇති (මෙහි මින් මතු "පැහැරහැරි බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) එම බැංකුවේ ව්‍යාපාර කටයුතු හෝ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන එම ව්‍යාපාර

කටයුතුවලින් යම් කොටසක්, එසේ පවරනු ලැබීමට කැමැත්ත ප්‍රකාශ කරන අවස්ථාවෝචිත පරිදි (මෙහි මින් මතු "අත්කර ගැනීමේ බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය බැංකුවකට පවරනු ලැබිය හැකි ය. මුදල් මණ්ඩලය විසින් එකී පැවරීම, අත්කර ගැනීමේ බැංකුව සහ පැහැරහැරි බැංකුව යන දෙකටම දැනුම් දීමට ඉඩ සැලැස්විය යුතු ය :

එසේ වුව ද, ඉහත කී මාස හයක කාලයක් ඇතුළත පැහැරහැරි බැංකුව ගණන් බේරා වසා දැමීම සඳහා කටයුතු ආරම්භ කරන ලද මුදල් මණ්ඩලය විසින්, ඉහත කී පරිදි එම බැංකුවේ ව්‍යාපාර කටයුතු හෝ එම ව්‍යාපාර කටයුතු වලින් කොටසක් රාජ්‍ය බැංකුවකට පසුව පැවරීම නීත්‍යානුකූල වන්නේය :

තවද එසේ වුව ද, මුදල් නීති පනතේ 30(10) (ආ) (i) වගන්තිය ප්‍රකාරව, මේ අනුඡේදය ක්‍රියාත්මක වීමේ දිනට පෙරාතුව කවර හෝ අවස්ථාවක දී බලපත්‍රලත් විශේෂිත බැංකුවක බලපත්‍රය අවලංගු කරනු ලැබ ඇති අවස්ථාවක, මේ අනු ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඊට අදාළ විය යුතු ය.

(ආ) අනුඡේදයේ කාර්යය සඳහා—

"රාජ්‍ය බැංකුව" යන්නෙන්, එහි කොටස් ප්‍රාග්ධනයෙන් වැඩි ප්‍රමාණයක් ආණ්ඩුවට අයත් වන්නා වූ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් වැඩිදෙනකු ආණ්ඩුව විසින් පත් කරනු ලබන්නා වූ 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව, බලපත්‍රලත් වාණිජ්‍ය බැංකුවක් හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවක් අදහස් වේ. සහ

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(3අ) (3) වන උපවගන්තියේ කාර්යය සඳහා "පැහැරහැරි බැංකුවක් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර කටයුතු" යන්නට—

(අ) (මුදල් ශේෂ, සංචිත අරමුදල්, ආයෝජන සහ තැන්පතු ඇතුළු) අදාළ දිනයට පෙරාතුව වූ දිනයේ දී පැහැරහැරි බැංකුවට අයත්ව තිබූ සියලු නිශ්චල සහ චංචල දේපළ ;

(ආ) අදාළ දිනයට පෙරාතුව වූ දිනයේ දී පැහැරහැරි බැංකුවට අයත්ව තිබූ යම් චංචල හෝ නිශ්චල දේපළකින් පැනනගින හෝ එම දේපළ නිසා ඇතිවන සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාරී බලතල සහ සම්බන්ධතා ;

(ඇ) අදාළ දිනයට පෙරාතුව වූ දිනයේ දී බලාත්මකව පවත්නා පැහැරහැරි බැංකුවේ සියලු බැරකම් ; සහ

(ඈ) එම ව්‍යවසායට අදාළව හෝ සම්බන්ධව ශ්‍රී ලංකාවේ ඇති සියලු පොත්, ගිණුම් සහ ලේඛන.

(3ආ) 76ක වගන්තියේ (3) උපවගන්තියේ (ආ) ඡේදයේ (i) උපඡේදය ප්‍රකාරව පැහැරහැරි බැංකුවේ ව්‍යාපාර කටයුතු අත්කර ගැනීමේ බැංකුව වෙත පවරනු ලැබූ දිනයේ සිට බලපවත්වන පරිදි—

(අ) පැහැරහැරි බැංකුවේ පවරන ලද ව්‍යාපාර කටයුතුවලට අදාළ හෝ ඒ හා සම්බන්ධ වූ ද එම බැංකුව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබුවා වූ ද අදාළ දිනයට පෙරාතුව වූ දිනයේ දී පවත්නා වූ හෝ බලාත්මකව පවතින්නා වූ ද, පැහැර හැරි බැංකුව පාර්ශවයක් වන්නා වූ හෝ පැහැරහැරි බැංකුවේ වාසියට වන්නා වූ ද සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟතා, ඇටෝර්නි බල, නෛතික නියෝජිත බලතල ප්‍රදානයන් සහ කවර ආකාරයක හෝ වෙනත් සාධන පත්‍ර අදාළ දිනයේ සිට බලපවත්වන පරිදි අත්කර ගැනීමේ බැංකුව විසින් අවස්ථාවෝචිත පරිදි ඇතුළත් වී ඇති හෝ ප්‍රදානය කර ඇති ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟතා, ඇටෝර්නි බල, නෛතික නියෝජිත බලතල ප්‍රදානයන් හෝ වෙනත් සාධන පත්‍ර සලකනු ලැබිය යුතු ය ;

(ආ) පැහැරහැරි බැංකුවේ පවරන ලද ව්‍යාපාර කටයුතුවලට අදාළව හෝ ඒ හා සම්බන්ධව එම බැංකුව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබුවා වූ

ද, අදාළ දිනයකට පෙරාතුව වූ දිනයේ දී නො අවසන්ව පවතින්නා වූ ද කවර ස්වභාවයක හෝ වූ සියලු නඩු සහ නඩු කටයුතු අදාළ දිනයේ සිට බලපවත්වන පරිදි අත්කරගැනීමේ බැංකුව විසින් හෝ ඊට එරෙහිව පවරන ලද නඩු සහ නඩු කටයුතු ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඒ නඩු සහ නඩු කටයුතු දිගටම පවත්වා ගෙන යාම හෝ නඩු කටයුතු කර ගෙන යාම හෝ කරනු ලැබිය හැකි ය.

(3ඇ) (අ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අත්කර ගැනීමේ බැංකුව වෙත පවරන ලද පැහැරහැරි බැංකුවේ බැරකම් පිළිබඳව ණය හිමියන්ගේ සහ තැන්පත්කරුවන්ගේ හිමිකම්පෑම් සහ ඉල්ලීම් සපුරාලීම සඳහා අත්කර ගැනීමේ බැංකුවට ඇති වගකීම්, පැහැරහැරි බැංකුවේ ව්‍යාපාර කටයුතු සමාලෝචනය කිරීම මත මුදල් මණ්ඩලය විසින් සකස් කරනු ලබන යෝජනා ක්‍රමයක නියම සහ කොන්දේසිවලට අනුකූලව විය යුතු අතර, එම යෝජනා ක්‍රමයේ දක්වා ඇති ප්‍රමාණයට පමණක් විය යුතු ය. යෝජනා ක්‍රමය සකස් කිරීමෙන් පසු මුදල් මණ්ඩලය විසින් එකී යෝජනා ක්‍රමය දිනපතා පුවත්පතක පිළිවෙලින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් පළකිරීමට සැලැස්විය යුතු ය:

එසේ වුව ද, අත්කර ගැනීමේ බැංකුවේ ලිඛිත කැමැත්ත ඇතිව මුදල් මණ්ඩලය විසින් යෝජනා ක්‍රමය කලින් කල වෙනස් කිරීම, විවිධ කිරීම හෝ මඳ වශයෙන් වෙනස් කිරීම නීත්‍යානුකූල වන්නේ ය. අවස්ථාවෝචිත පරිදි එවැනි යම් වෙනස් කිරීමක්, විවිධ කිරීමක් හෝ මඳ වශයෙන් වෙනස් කිරීමක් දිනපතා පුවත්පතක පිළිවෙලින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළ කළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් යෝජනා ක්‍රමයක් මගින්—

(i) ගෙවිය යුතු මුදල් සහ ඒ මුදල් ගෙවිය යුතු වේලාවන් ද ඇතුළුව අත්කර ගැනීමේ බැංකුව විසින් පැහැරහැරි බැංකුවේ වගකීම් ඉටු කිරීමේ ක්‍රමය නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය ;

(ii) අත්කර ගැනීමේ බැංකුව වෙත පවරනු ලැබූ පැහැරහැරි බැංකුවේ විවිධ පංතිවල බැරකම් ගෙවා බේරුම් කිරීම සඳහා ප්‍රමුඛතා අනුපිළිවෙලක් සකස් කරනු ලැබිය හැකි ය ;

(iii) මුදල් ගෙවීමේ ප්‍රමාණයන් පැහැරහැරි බැංකුවේ තැන්පත්කරුවන්ගේ හෝ ණය හිමියන්ගේ යම් පංතියකට හෝ වර්ගයකට සීමා කරනු ලැබිය හැකි ය ;

(iv) තැන්පතු වගකීම් නැවත උපලේඛනගත කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය ;

(v) බැරකම් ගෙවා බේරුම් කිරීම පැහැරහැරි බැංකුවේ වත්කම්වල හෝ මුදල් මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කළ හැකි වෙනත් වත්කම්වල හෝ ප්‍රමාණයට සීමා කළ යුතු බවට නිශ්චිතව සඳහන් කළ හැකි ය.

(3ඈ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මෙහි (3ඈ) උපවගන්තිය ප්‍රකාරව මුදල් මණ්ඩලය විසින් සකස් කරන ලද යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසිවලට අනුකූලව බැරකම් ගෙවා බේරුම් කිරීම මගින් මෙහි සලසා ඇති පරිදි, අත්කර ගැනීමේ බැංකුව වෙත පවරා ඇති පැහැරහැරි බැංකුවේ වගකීම් අවසන් විය යුතු ය.

(3ඉ) (3) උපවගන්තියේ (ආ) ඡේදයේ (i) (ආ) උපඡේදය ප්‍රකාර පැහැරහැරි බැංකුවක් අත්කර ගැනීමේ බැංකුවක් වෙත පවරනු ලැබීමේ දී, මුදල් මණ්ඩලය විසින් සකස් කරන ලද යෝජනා ක්‍රමයේ නියමවලට අනුව අත්කර ගැනීමේ බැංකුව වෙත පවරන ලද වගකීම් ඉටු කිරීමට එම අත්කර ගැනීමේ බැංකුවට ඇති හැකියාව මුදල් මණ්ඩලය විසින් සැලකිල්ලට ගතයුතු අතර, එම යෝජනා ක්‍රමයට අනුකූලව කටයුතු කිරීමට ඇති කැමැත්ත

ලිඛිතව දැන්වීමට අත්කර ගැනීමේ බැංකුවට නියම කළ යුතු ය.

(3ඊ) ජාතික ආර්ථිකයේ යහපත පිණිස එසේ කිරීම අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වූ සහ ඉහත කී විධිවිධාන ප්‍රකාරව අත්කර ගැනීමේ බැංකුවක් වෙත පවරා ඇත්තා වූ ද යම් ආණ්ඩුවේ ආයතනයකට, පළාත් සභාවකට හෝ පළාත් සභාවක් යටතේ ක්‍රියා කරන්නා වූ වෙනත් පුද්ගල මණ්ඩලයකට හෝ අධිකාරියකට, රාජ්‍ය සංස්ථාවකට හෝ වෙනත් රාජ්‍ය ආයතනයකට හෝ පළාත් පාලන ආයතනයකට පැහැර හැරි බැංකුවකින් අයවිය යුතු වූ ද යම් තැන්පතු බැරකම් හෝ එහි යම් කොටසක් ආණ්ඩුවට අයවිය යුතු බැරකම් විය යුතු බවට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(3උ) (3අ) සහ (3ආ) යන උපවගන්තිවල කාර්යය සඳහා "අදාළ දිනය" යන්නෙන් (3) උපවගන්තියේ (ආ) ඡේදයේ (i) (ආ) උපඡේදය ප්‍රකාර පැහැරහැරි බැංකුව අත්කර ගැනීමේ බැංකුව වෙත පවරනු ලැබූ දිනය අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.